(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 3(6).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2026 පෙබරවාරි 13 සිකුරාදා**

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න
**(2026 මාර්තු 03 අඟහරුවාදා)**

1864/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පානදුර, බටහිර මාලමුල්ල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ‘ප්‍රසන්න ඔටෝ සර්විස්’ නම් ව්‍යාපාරය පිළිබඳව යොමු කරන ලද WP/KT/PPA/WP-K/0119/2025 දරන පැමිණිල්ල සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් ගෙන ඇති පියවර කවරේද;

(ii) එම පැමිණිල්ලට අදාළව ඉදිරි නීතිමය පියවර ගෙන තිබේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(iv) පැමිණිල්ල විභාග කිරීමට ප්‍රමාද වීමට හේතුව කවරේද;

(v) එම පැමිණිල්ලට අදාළව ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1865/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ හිමිකම් සහතික ලබා දීම ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(ii) මේ දක්වා එම පනත යටතේ ලබාදී ඇති හිමිකම් සහතික ප්‍රමාණය කොපමණද;

(iii) හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ මේ වනවිට සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ නීතිමය තත්ත්වය යාවත්කාලීන කිරීමට අපේක්ෂා කරන්නේද;

(ii) එසේ නම්, යෝජිත නීතිමය ප්‍රතිසංස්කරණ කවරේද;

(iii) එම නීතිමය ප්‍රතිසංස්කරණ කඩිනම් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1866/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'Clean Sri Lanka' ජනාධිපති කාර්යසාධක බලකායේ වර්තමාන සාමාජිකයන් කවුරුන්ද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ මෙතෙක් ක්‍රියාත්මක කොට අවසන් කරන ලද ව්‍යාපෘති කවරේද;

(iii) එලෙස අවසන් කර ඇති ව්‍යාපෘති සඳහා වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම ව්‍යාපෘති සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය එක් එක් ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2024.12.19 දිනැති අංක 2415/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ විස්තර කර ඇති I සිට IX දක්වාවූ එක් එක් කාර්යයේ මේ වනවිට ප්‍රගතිය සහ ඒ සඳහා වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 මාර්තු 17 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

230/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය වෙනුවෙන් නඩු කටයුතු මෙහෙයවීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් පරිබාහිරව පළාත්බද රජයේ ප්‍රධාන අභිචෝදක කාර්යාල (Provincial Directorate of Public Prosecution) ස්ථාපිත කරන බව 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් පොරොන්දුවී තිබේද;

(ii) ඉහත කී ප්‍රතිපත්තිය නිවැරදි බව පිළිගන්නේද;

(iii) එසේ නම්, ඉහත පොරොන්දුව ප්‍රකාරව නීතිපති දෙපාර්තමේන්තුවෙන් පරිබාහිරව ශ්‍රී ලංකාවේ එක් එක් පළාත සඳහා පළාත්බද රජයේ ප්‍රධාන අභිචෝදක කාර්යාල මේ වනතෙක් ස්ථාපිත නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

460/2025

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රධාන ඖෂධ නිෂ්පාදන කිහිපයක් සම්බන්ධයෙන් ගුණාත්මක අසාර්ථකත්වයන් හිතාමතා නිර්මාණය කිරීමෙන් අත්‍යාවශ්‍ය ඖෂධ සැපයුම්කරුවන් අපකීර්තියට පත් කිරීම සහ සැපයුම්වලින් ඉවත් කිරීම වැනි තත්ත්ව උද්ගතවී තිබේද;

(ii) පසුගිය වසර 05 තුළ, විවිධ හේතු මත 2-8 °C අතර උෂ්ණත්වයක ගබඩා කළ යුතු ජීවිතාරක්ෂක/මිල අධික ඖෂධ භාවිතයෙන් ඉවත් කිරීමට සිදුවූ අවස්ථා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඖෂධවල ගුණාත්මක ගැටලු ඇති කිරීම මඟින් දිගු කාලීන සැපයුම්කරුවන් ඉවත් කිරීම ප්‍රාදේශීය රෝහල් මට්ටමෙන්ද සිදු වන බවත්;

(ii) මේ හේතුවෙන් ඔවුන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ටෙන්ඩර් සඳහා ඇස්තමේන්තු ලබාදීම ප්‍රතික්ෂේප කරන බවත්;

(iii) ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ඉවත් කර ඇති ඖෂධ සංඛ්‍යාව, කාණ්ඩ ආපසු ගැනීම් හෝ නිෂ්පාදන ආපසු ගැනීම් පිළිබඳවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම ඉවත් කළ ඖෂධ පෞද්ගලික වෙළඳපොළ තුළ අලෙවි කරන බව දන්නේද;

(ii) එවැනි අක්‍රමිකතා සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කළ හැකි අංශයක් තිබේද;

(iii) එසේ නම්, 2024 වර්ෂයේ ලැබුණු එවැනි පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

464/2025

ගරු රවී කරුණානායක මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2021 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාව මාළු ආනයනය කර තිබේද;

(ii) එසේ නම්, 2021 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී ආනයනය කරන ලද මාළු වර්ගය, ප්‍රමාණය, ඒවායෙහි වටිනාකම සහ ගෙන්වන ලද රට වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එසේ ආනයනය කරන ලද්දේ දේශීය පරිභෝජනය සඳහාද, නැතහොත් ප්‍රතිඅපනයනය සඳහාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ ආනයනය කරන ලද්දේ දේශීය පරිභෝජනය සඳහා නම්, උපයන ලද තීරු බදුවල වටිනාකම කොපමණද;

(ii) ආනයනය කරන ලද්දේ ප්‍රතිඅපනයනය කිරීම සඳහා නම්, එකතු කළ අගය සහ උපයන ලද විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

(iii) ආනයනය කරන ලද කරවල, හාල්මැස්සන් සහ උම්බලකඩ ප්‍රමාණය, වටිනාකම සහ ගෙන්වන ලද රටවල් කවරේද;

(iv) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද කරවල, හාල්මැස්සන් සහ උම්බලකඩ ප්‍රමාණය කොපමණද;

(v) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද ටින් මාළු ප්‍රමාණය සහ එහි වටිනාකම කොපමණද;

(vi) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද ටින් මාළු ප්‍රමාණය කොපමණද;

යන්නත් 2021 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

682/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා නොරොච්චෝලේ 'ලක් විජය' විදුලි බලාගාරයෙන් ජාතික විදුලිබල පද්ධතියට ලැබුණු දායකත්වය කොපමණද;

(ii) එම කාලය තුළ ඉහත විදුලි බලාගාරය ඇණ හිටි අවස්ථා සංඛ්‍යාව සහ දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් ඇණ හිටීම් හේතුවෙන් අඛණ්ඩ විදුලිබල සැපයුමට එල්ලවූ බාධා කවරේද;

(iv) ඉහත බලාගාරයේ ඇති විදුලි ජනන යන්ත්‍ර නිරන්තරයෙන් ඇණ හිටීමට හේතු කවරේද;

(v) ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

882/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළේපත්තුව, වාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති රජයේ ඉඩම් සඳහා 2017.01.01 සිට 2025.03.31 දක්වා කාලවකවානුව තුළ රජයේ 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' ලබා දුන් ඉඩම්වල ජනතාව පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

914/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, පශු සම්පත් සංවර්ධන උපදේශකවරුන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ගවයන්ගේ කෘත්‍රිම සිංචනය සඳහා එම උපදේශකවරුන්ට අමතරව කොන්ත්‍රාත් සේවකයන් සිටින්නේද;

(iii) එම සේවකයන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඔවුන්ට දීමනා ගෙවන පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කෘත්‍රිම සිංචනය සඳහා ගාස්තුවක් අය කරන්නේද;

(ii) එක් කෘත්‍රිම සිංචනයකට ගාස්තුව කොපමණද;

(iii) ඉහත උපදේශකවරයෙකු සහ කොන්ත්‍රාත් සේවකයෙකු එක් කෘත්‍රිම සිංචනයකට අය කරන ගාස්තුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත ගාස්තු දෙකම සමාන නම්, එය විෂමතාවයක් නොවන්නේද;

(v) දෙවැනි හෝ තෙවැනි කෘත්‍රිම සිංචනයේදීත් ඉහත ගාස්තුවම අය කරන්නේද;

(vi) එසේ නම්, එය අසාධාරණයක් නොවන්නේද;

(vii) කෘත්‍රිම සිංචනයේ ඵලදායිතාවය ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(viii) ගවයන්, එළුවන් සහ ඌරන් ආදී සතුන්ගේ රෝගවලට ප්‍රතිකාර කිරීමට ගොවිපළට පැමිණෙන පශු වෛද්‍ය නිලධාරීන්ට/පශු සම්පත් සංවර්ධන උපදේශකවරුන්ට ගාස්තු ගෙවිය යුතුද;

(ix) එසේ නම්, එම ගාස්තු ප්‍රවාහනයටද, ඖෂධවලටද යන්න වෙන් වෙන්ව ලදුපත්වල සඳහන් කළ යුතු නොවන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1245/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති සිවිල් ආරක්ෂක බළකායේ මූලස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් මූලස්ථානය වෙත අනුයුක්ත කර සිටින නිලධාරීන් හා භටයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට එම නිලධාරීන් සහ භටයන් යොදවා ඇති කාර්යයන් කවරේද;

(iv) එම එක් එක් කාර්යයට අනුයුක්ත කර ඇති නිලධාරීන් හා භටයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මූලස්ථාන විසින් ගොවිපළ හා ව්‍යාපාර පවත්වාගෙන යන්නේද;

(ii) එසේ නම්, එම ගොවිපළ හා ව්‍යාපාර කවරේද;

(iii) එම එක් එක් ගොවිපළට/ව්‍යාපාරයට අයත් භූමි ප්‍රමාණය, පිහිටුවා ඇති ප්‍රදේශය සහ අනුයුක්ත කර ඇති නිලධාරීන් හා භටයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2024 සහ 2025 වර්ෂවල ඉහත සඳහන් එක් එක් ගොවිපළේ/ව්‍යාපාරයේ ආදායම හා වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1372/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය,— කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) සිය දෙමාපියන් අහිමි, නිසි රැකවරණයක් නොමැති දරුවන් ලෙස හඳුනාගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

(ii) එම දරුවන්ගේ රැකවරණය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) මෙම දරුවන් හඳුනාගැනීම සහ ඔවුන්ට රැකවරණය සැලසීම සඳහා සෑම ග්‍රාම නිලධාරි වසමක්ම ආවරණය වන පරිදි රජයේ නිලධාරියෙක් පත් කර තිබේද;

(iv) එසේ නම්, එම නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) එම නිලධාරීන්ගේ කාර්යභාරය අධීක්ෂණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1678/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නායයෑමේ තර්ජනයක් හේතුවෙන් මොරවක මහෙස්ත්‍රාත් අධිකරණය 2021 වර්ෂයේ සිට ගැටබරු රජමහා විහාරයේ ශාලාවක තාවකාලිකව පවත්වාගෙන යන බවත්;

(ii) ඒ සඳහා විශාල මුදලක් මාසික කුලිය ලෙස වැයවන බවත්;

(iii) තාවකාලික ගොඩනැගිල්ලේ ඉඩ ප්‍රමාණය, භෞතික සම්පත් සහ තාක්ෂණික පහසුකම් ප්‍රමාණවත් නොවීමෙන් අධිකරණ කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට නොහැකිවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මූලා පාඩුව වළක්වා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) මහෙස්ත්‍රාත් අධිකරණය පෙර පැවති භූමිය පිළිබඳව භූ විද්‍යාත්මක තත්ත්ව වාර්තාවක් මේ වනවිට ලැබී තිබේද;

(iii) එම වාර්තාව මඟින් ලබාදී ඇති නිර්දේශ කවරේද;

(iv) මොරවක මහෙස්ත්‍රාත් අධිකරණය ස්ථිරව ස්ථානගත කිරීම සඳහා ගතවන කාලවකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1711/2025

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා ලබාදී ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඒ යටතේ අධ්‍යාපන, මාර්ග සහ යටිතල පහසුකම් යන අංශයන්ට ලබාදී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට, ඉහත ප්‍රතිපාදනවලින් වියදම් කර ඇති ප්‍රමාණය ඉහත (ii)හි සඳහන් අංශ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ව්‍යාපෘතිවලින් 2025.12.31 වන දිනට අවසන් වීමට නියමිතව තිබූ ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2026 මාර්තු 18 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

746/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාව හැර ගොස් සිටින නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) නීතිපති දෙපාර්තමේන්තුවේ විශේෂ දක්ෂතා ඇති නිලධාරින් මේ වනවිට හිඟ වීමෙන් එක් නිලධාරියෙකු විසින් ලිපි ගොනු 200-300ක් පමණ හසුරුවන බව දන්නේද;

(iii) ඒ හේතුවෙන් ඇතිවී තිබෙන ප්‍රමාදය අවම කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) නීතිපති දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

841/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් පාලනය කරනු ලබන කොළඹ, ජාතික කලාභවන ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වසා දමන ලද දිනය කවරේද;

(ii) එම ප්‍රතිසංස්කරණ කටයුතු මේ වනතෙක් අවසන්වී නොමැති බව දන්නේද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(iv) එහි තැන්පත් කර තිබූ, මිල කළ නොහැකි, පෞරාණික චිත්‍ර 42ක් මේ වනවිට අස්ථානගතවී ඇති බව පිළිගන්නේද;

(v) මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1013/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට විභාග කෙරෙමින් පවතින, විමර්ශන සිදු කෙරෙමින් පවතින, නීතිමය පියවර ගනිමින් තිබෙන සහ විසඳා ඇති සයිබර් මූල්‍ය අපරාධ සිද්ධීන් සංඛ්‍යාව එක් එක් පළාත සහ වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සයිබර් මූල්‍ය අපරාධ සිද්ධීන් විමර්ශනය කර නඩු පැවරීමට ගතවන සාමාන්‍ය කාලය කොපමණද;

(iii) මූල්‍ය වංචා පිළිබඳ විශේෂඥ දැනුමක් සහිත, සයිබර් මූල්‍ය අපරාධ විමර්ශනය කිරීම සඳහාම වෙන්වූ ඒකක සියලුම පළාත්වල ස්ථාපනය කර තිබේද;

(iv) සයිබර් මූල්‍ය අපරාධ විමර්ශනය කිරීම සඳහා කෘත්‍රිම බුද්ධිය පාදක කර ගත් වංචා හඳුනාගැනීමේ පද්ධති වැනි උසස් තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳ රජයේ ස්ථාවරය කුමක්ද;

(v) මූල්‍ය ආයතන සමඟ සහයෝගීත්වයෙන් කටයුතු කිරීම සහ කෘත්‍රිම බුද්ධිය පාදක කර ගත් වංචා හඳුනාගැනීමේ පද්ධති වැනි උසස් තාක්ෂණය භාවිතා කිරීම ඇතුළුව සයිබර් මූල්‍ය අපරාධ වැළැක්වීම සඳහා රජය ගෙන ඇති පියවර මොනවාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1186/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිලි/ කිලිනොච්චි මධ්‍ය මහා විද්‍යාලය යනුවෙන් ජාතික පාසලක් තිබෙන බවත්;

(ii) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඇති ජාතික පාසල් දෙකෙන් එකක් වන ඉහත පාසලේ අධ්‍යාපන මට්ටම මේ වනවිට පසුබෑමට ලක්වී ඇති බවත්;

(iii) පාසලේ ගුරු පුරප්පාඩු, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සහ ගෘහ භාණ්ඩ ඇතුළු සම්පත් හිඟයක් පවතින බවත්;

(iv) එම පුරප්පාඩු නොපුරවා සිසුන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ නැංවිය නොහැකි බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත පාසලේ මේ වනවිට සේවය කරනු ලබන විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ අනධ්‍යයන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පාසලේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු මේ දක්වා නොපිරවීමට හේතු කවරේද;

(iii) ඉහත පාසලේ පවතින සියලු පුරප්පාඩු සම්පූර්ණයෙන්ම පුරවනු ලබන දිනය කවරේද;

(iv) ඉහත පාසලේ ගොඩනැගිලි සහ ගෘහ භාණ්ඩ අවශ්‍යතාවය සම්පූර්ණ කරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1303/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන කලාපවලට අනුයුක්තව වැඩ බැලීමේ පදනම මත ගුරු උපදේශකවරුන් සහ සම්පත් දායකයන් ලෙස සේවය කරනු ලබන නිලධාරින්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඒ අතරින් නැගෙනහිර පළාත් අධ්‍යාපන ලේකම්, නැගෙනහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සහ නැගෙනහිර පළාත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් වැඩ බැලීමේ පදනම මත ගුරු උපදේශකවරුන් සහ සම්පත් දායකයන් ලෙස පත් කර ඇති නිලධාරින්ගේ නම් කවරේද;

(iii) දීර්ඝ කාලයක් වැඩ බැලීමේ පදනම මත සේවය කරනු ලබන ගුරු උපදේශකවරුන් සහ සම්පත් දායකයන් ස්ථිර කිරීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1360/2025

ගරු තුරෙරෙරාසා රවිකරන් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුල්ලිකුලම් ප්‍රදේශයේ ජනතාවට අයත් ඉඩම් 2007 වර්ෂයේ සිට යුද හමුදාව යටතේ පවතින බැවින්, එම ප්‍රදේශයෙන් අවතැන්වූ ජනතාවට මේ වන තෙක් තමන්ගේ ගම්මානවලට ආපසු යැමට නොහැකිවී ඇති බව දන්නේද;

(ii) එම ජනතාවට තමන්ගේ වාසස්ථානවල නැවත පදිංචි වීමට නොහැකි වීමට හේතු කවරේද;

(iii) මෙම ප්‍රදේශයේ අවතැන්වූ පවුල් 300කට අධික සංඛ්‍යාවකට නිසි නිවාස පහසුකම්, ජීවනෝපාය අවස්ථා සහ මූලික පහසුකම් නොමැති අතර, එම ජනතාව වෙනුවෙන් රජය විසින් මෙතෙක් ලබාදී ඇති සහන කවරේද;

(iv) මුල්ලිකුලම් ජනතාව සතු පාරම්පරික ඉඩම්, නිවාස, පාසල් සහ ආගමික ස්ථාන වර්තමානයේ නාවික හමුදාව යටතේ පවතින්නේද;

(v) එසේ නම්, ඒවා නිදහස් කොට ජනතාවට නැවත භාරදීමට ගනු ලබන පියවර කවරේද;

(vi) එම අවතැන්වූ ජනතාව ඔවුන්ගේ ස්ථිර වාසස්ථානවල නැවත පදිංචි කිරීම සඳහා තිරසර සැලැස්මක් හෝ නිශ්චිත කාලරාමුවක් තිබේද;

(vii) එසේ නම්, එම ක්‍රියාදාමය සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1407/2025

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට භාර කර ඇති 2011 වර්ෂයේදී රජයේ සේවකයන්ට ලබා දුන් වවුනියාව දිස්ත්‍රික්කයේ ඕමන්ත-වේප්පන්කුලම් ප්‍රදේශයේ පර්චස් 20ක් බැගින්වූ ඉඩම් කැබැලි 125ක් සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් දීමනා පත්‍ර ලබා දිය යුතු බව දන්නේද;

(ii) වසර 14කට පෙර රජයේ සේවකයන්ට ලබා දුන් සංවර්ධනය නොකළ එම ඉඩම් සංවර්ධනය කිරීමෙන් පසු වත්මන් වටිනාකමට ඇස්තමේන්තු කර තිබේද;

(iii) එසේ නම්, එම ඉඩම් ලබාදුන් අවස්ථාවේදී තිබූ වටිනාකම සැලකිල්ලට ගනිමින් එම දේපළ නැවත තක්සේරු කරනු ලබන්නේද;

(iv) නැවත ඇස්තමේන්තු කිරීම සිදු කරන කාලවකවානු කවරේද;

(v) නැවත ඇස්තමේන්තු කිරීමෙන් අනතුරුව, අදාළ පදිංචිකරුවන්ට ඉඩම් බලපත්‍ර ලබා දිය හැකි කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1469/2025

ගරු චානක මාදුගොඩ මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල, බෙලිගහ, නව අධිකරණ සංකීර්ණය 2024 ජූලි 19 දින විවෘත කරන ලද නමුත් මේ වනතෙක් එහි නීති කෘත්‍යයන් ආරම්භ නොකිරීමට හේතුව කවරේද;

(ii) එම අධිකරණ සංකීර්ණයේ නීති කෘත්‍යයන් ආරම්භ කිරීමට අපේක්ෂා කරනු ලබන දින වකවානු කවරේද;

(iii) ඉහත සඳහන් නව සංකීර්ණයේ රාජකාරි කටයුතු ආරම්භ කිරීමෙන් පසු මේ වනවිට අධිකරණ කටයුතු පවත්වාගෙන යනු ලබන ගාල්ල කොටුව පෞරාණික ගොඩනැගිලි හා එම පරිශ්‍රය භාවිත කිරීමට අපේක්ෂිත අරමුණු කවරේද;

(iv) ගාල්ල, බෙලිගහ, නව අධිකරණ සංකීර්ණයේ ගොඩනැගිලි සහ භූමිය මේ වනතෙක් භාවිතයට නොගැනීමෙන් සිදුවී ඇති අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1514/2025

ගරු රොෂාන් අක්මීමන මහතා,— වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2024 දක්වා ත්‍රිකුණාමලය වරායේ මෙහෙයුම් ලාභය/ අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ත්‍රිකුණාමලය වරායට අයිතිව තිබූ ජැටි හෝ පර්යන්ත බදු පදනම මත හෝ වෙනත් පදනමක් මත විවිධ පෞද්ගලික සමාගම් සඳහා ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම සමාගම් කවරේද;

(iv) ඉහත සමාගම් විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවිය යුතු බදු හෝ වෙනත් ගෙවීම් නිසි පරිදි ගෙවා තිබේද;

(v) එසේ නම්, වර්ෂ 2005 සිට 2024 දක්වා එම ගෙවීම් සම්බන්ධ තොරතුරු එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ත්‍රිකුණාමලය වරාය සතුව පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ රජයේ හිමිකාරිත්වයක් සහිත ජැටි හෝ පර්යන්ත තිබේද;

(ii) එසේ නම්, එම ජැටි හෝ පර්යන්ත කවරේද;

(iii) ත්‍රිකුණාමලය වරාය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් පවතින සැලසුම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1771/2025

ගරු සුනිල් රත්නසිරි මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය මඟින් මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලෙයිපත්තු දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුරුත්තානෙ ග්‍රාම නිලධාරි වසමේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

(iii) එම ව්‍යාපෘති සඳහා වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

(iv) මේ වනවිට එම ව්‍යාපෘතිවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 මාර්තු 19 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1455/2025

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත්පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම් දිස්ත්‍රික්කයේ, ග්‍රාම නිලධාරි වසම් 153 අතරින්, ග්‍රාම නිලධාරින්, සංවර්ධන නිලධාරින් සහ සමෘධි සංවර්ධන නිලධාරින් සඳහා භාවිතා කිරීම සඳහා බහුකාර්ය කාර්යාල (සේවා පියස) නොමැති ග්‍රාම නිලධාරි වසම් තිබේද;

(ii) එසේ නම්, තාවකාලිකව විකල්ප ස්ථානවල ක්‍රියාත්මක වන කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iii) ප්‍රතිසංස්කරණය කළ යුතු කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iv) වැසිකිළි, ජල සහ විදුලි පහසුකම් නොමැති කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(v) විදුලිය විසන්ධි කර ඇති කාර්යාල සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම අඩුපාඩු මහජනතාවට ගුණාත්මක සේවාවක් සැපයීමට බාධාවක් බව දන්නේද;

(ii) එවැනි අපහසුතා නිරාකරණය කර ගුණාත්මක හා කඩිනම් සේවාවක් සැපයීම සඳහා අදාළ අඩුපාඩු සපුරාලීමට ඇති සැලැස්ම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1502/2025

ගරු බී. ආරියවංශ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ කෙසෙල් වගාව සිදු කරනු ලබන ප්‍රදේශ කවරේද;

(ii) එම දිස්ත්‍රික්කයේ කෙසෙල් වගාවේ නිරත වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) කෙසෙල් සඳහා සාධාරණ මිලක් ලබා ගැනීමට නොහැකිවීමෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ කෙසෙල් වගාකරුවන් පීඩා විඳින බව දන්නේද;

(iv) රත්නපුර දිස්ත්‍රික්කයේ කෙසෙල් වගාකරුවන් මුහුණ දෙන ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1544/2025

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යටියන්තොට, වී ඔය ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ජලාශ ව්‍යාපෘතිය කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතිය කවර ආයතනයක්/සමාගමක් මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන බව හෝ නොකරන බව ජනතාවට නිශ්චිතව දැනුම් නොදීමට හේතු කවරේද;

(ii) එම ව්‍යාපෘතිය හේතුවෙන් ජනතාවට සිදුවන හානිය හා පීඩාව සම්බන්ධයෙන් නිසි අධ්‍යයනයක් සිදු කර තිබේද;

(iii) ව්‍යාපෘතිය හේතුවෙන් සෘජු හා වක්‍ර බලපෑම්වලට ලක්වන පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) නායයාමේ අධි සංවේදී කලාපයක් ලෙස නම් කර ඇති කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි මෙම ප්‍රදේශයේ පිහිටි කඳු දෙකක් හරස් කර ඉහත ජලාශ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් අනාගතයේදී සිදු වන බලපෑම් කවරේද;

(v) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන බව හෝ නොකරන බව නිශ්චිතව දැනුම් දෙන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1551/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල මුස්ලිම් ආගමික විද්වතුන් බිහිකරන අරාබි විද්‍යාල ක්‍රියාත්මක වන බවත්;

(ii) එම විද්‍යාල වර්ගීකරණය මත පදනම්ව කාණ්ඩ 3කට ශ්‍රේණි ගත කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අරාබි විද්‍යාල වැඩි සංඛ්‍යාවක් පළමු ශ්‍රේණියට අයත් වන බැවින්, ඒවා දෙවැනි සහ තෙවැනි ශ්‍රේණි දක්වා උත්ශ්‍රේණි ගත කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) එම අරාබි විද්‍යාල උත්ශ්‍රේණි ගත කිරීම සඳහා පවතින බාධා සහ කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1558/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන කවරේද;

(iii) එම එක් එක් පළාත් පාලන ආයතනයට අයත් ඡන්දදායකයින්, කොට්ඨාස සහ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පළාත් පාලන ආයතන සහ පළාත් පාලන කොට්ඨාස බෙදා වෙන් කර ඇති පදනම සහ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව තීරණය කර තිබෙන පදනම කවරේද;

(v) එමඟින්, සමහර සභාවන්ට මෙන්ම ඡන්දදායකයින්ටද අසාධාරණයක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා විසඳුමක් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මොරවැව, ගෝමරන්කඩවල, පදවි ශ්‍රීපුර, සේරුවිල සහ වෙරුගල් යන ප්‍රාදේශීය සභා පහට අයත් මුළු ඡන්දදායකයින් සංඛ්‍යාවට වඩා මූතූර් ප්‍රාදේශීය සභාවේ මුළු ඡන්ද දායකයින් සංඛ්‍යාව වැඩි බව දන්නේද;

(ii) ජනගහනය, ග්‍රාම නිලධාරි කොට්ඨාස සංඛ්‍යාව සහ භූමි ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් මූතූර් ප්‍රාදේශීය සභාව පළාත් පාලන ආයතන දෙකකට වෙන් කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1716/2025

ගරු ආර්.ජී. විජේරත්න මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012 හා 2013 වර්ෂයන්හි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජාතික ගිණුම් අංශයේ සේවය කළ නිලධාරියෙකුගේ වැඩ තහනම් කළ බව දන්නේද;

(ii) එසේ නම්, එම නිලධාරියාගේ නම කවරේද;

(iii) එම නිලධාරියාට යුක්තිය හා සාධාරණත්වය ඉටු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආර්ථිකය පිළිබඳ අධි සංවේදී දත්ත විකෘති කිරීම වළක්වා ගැනීම සඳහා වන වත්මන් රජයේ වැඩපිළිවෙළ කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1721/2025

ගරු ඕෂානි උමංගා මහත්මිය,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ කම්කරු නීති සංශෝධනය කරමින් පවතින්නේද;

(ii) එසේ නම්, සංශෝධනය කරනු ලබන අංශ කවරේද;

(iii) එම සංශෝධන සඳහා මැදිහත් වන බාහිර පාර්ශ්වයන් කවරේද;

(iv) එම සංශෝධන සිදු කිරීම අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන කාල රාමුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1783/2025

ගරු තිළිණ සමරකෝන් මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉපලෝගම සහ කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල, 621-ඉහලගම, 510-කඩියංගල්ල සහ 502-මානෑව ග්‍රාම නිලධාරි වසම් තුළ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ නිවාස ව්‍යාපෘති තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම නිවාස ව්‍යාපෘතිවල නම් සහ ක්‍රියාත්මක කළ දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම නිවාස ව්‍යාපෘති 03හි ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ප්‍රතිලාභීන්ට ප්‍රතිපාදන ලබා දෙන ලද්දේ ආධාරයක් ලෙසද, ණය මුදලක් ලෙසද;

(v) එම ප්‍රතිලාභීන් සඳහා ලබා දුන් මුදල, නිවාස තනා නිම කර ඇති සංඛ්‍යාව සහ මේ වනවිට එම නිවාසවල පදිංචිවී සිටින සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ප්‍රතිලාභීන් තෝරාගත් ආදායම් පදනම කවරේද;

(vii) එම ප්‍රතිලාභීන් තෝරාගත් අවස්ථාවේදී ඔවුන්ගේ ආදායම් තත්ත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1822/2026

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලද වර්ෂය කවරේද;

(ii) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමට පෙර, මෝටර් රථයක් ලියාපදිංචි කිරීමේ වගකීම භාරව සිටි ආයතනය කවරේද;

(iii) ශ්‍රී ලංකාව තුළ පළමුවැනිවරට මෝටර් රථයක් ලියාපදිංචි කරන ලද වර්ෂය කවරේද;

(iv) එම වර්ෂයේ සිට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන තෙක් ලියාපදිංචි කළ වාහන සංඛ්‍යාව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2025 දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කර ඇති මෝටර් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෝටර් රථ සඳහා වායු විමෝචන දූම සහතික නිකුත් කිරීම තුළින් රජය වාර්ෂිකව ආදායමක් උපයන්නේද;

(iii) එසේ නම්, 2025 වර්ෂයේදී උපයන ලද ආදායම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1860/2026

ගරු රුවන් විජේවීර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, ජාතික පාසල් සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පාසල්වල ස්ථාපිත කර ඇති ශ්‍රවණාගාර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බුත්තල දුටුගැමුණු මධ්‍ය මහා විද්‍යාලයේ ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් ආරම්භ කළ දිනය කවරේද;

(ii) ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iii) එම ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදයක් තිබේද;

(iv) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 මාර්තු 20 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

24/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේ සිට මේ දක්වා විදේශ රැකියාවල නිරතව සිටියදී විවිධ පීඩාවන්ට පත්වී ඇති ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන් අතරින් මේ වනවිට වන්දි ලබාදී ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) මෙලෙස පීඩාවන්ට පත්වන ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයන්ට ලබා දෙන ලද වන්දි මුදල වැඩි කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

121/2024

ගරු වමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අටවැනි විධායක ජනාධිපතිවරයාගේ ධුර කාලය තුළ ජනාධිපති ලේකම් කාර්යාලයේ වාහන සංචිතයේ තිබූ නිල වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන සංචිතයෙන් වෙනත් රාජ්‍ය ආයතන වෙත වාහන අනුයුක්ත කර තිබුණේද;

(iii) එසේ නම්, එම වාහන සංඛ්‍යාව කොපමණද;

(iv) 2024 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පැවති ජනාධිපතිවරණයෙන් පසු එම වාහන අතරින් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත නැවත භාරදුන් වාහන සංඛ්‍යාව කොපමණද;

(v) භාරදුන් වාහන නැවත භාවිතයට ගෙන තිබේද;

(vi) නොඑසේ නම්, එම වාහන සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ජනාධිපති ලේකම් කාර්යාලයේ වාහන සංචිතයේ ඇති නිල වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල වාහන භාවිතය සම්බන්ධයෙන් වන ප්‍රතිපත්තිය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

208/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ලැක්මියුලෙස්' එන්නත් මිලට ගැනීමේදී වෛද්‍ය සැපයීම් අංශයේ සිදුවී ඇති වංචාව සම්බන්ධයෙන් දැනුම්වත්වී තිබේද;

(ii) එම වංචාව සම්බන්ධයෙන් චෝදනා එල්ලවූ නිලධාරින්ගේ නම් හා තනතුරු නාම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම වංචාව සම්බන්ධව සිදු කරනු ලබන පරීක්ෂණවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

231/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරල්වරයෙක් යටතේ නීතිපති දෙපාර්තමේන්තුවේ පළාත්බද කාර්යාල ස්ථාපිත කිරීමට 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් පොරොන්දුවී තිබේද;

(ii) එසේ නම්, මේ වනවිට එක් එක් පළාතේ පළාත්බද නීතිපති දෙපාර්තමේන්තු කාර්යාල සඳහා අනුයුක්ත කර ඇති සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නීතිපති දෙපාර්තමේන්තුවේ පළාත්බද කාර්යාල ස්ථාපිත කිරීම සඳහා මේ වනවිට ආයෝජනය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

356/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ පැවති යහපාලන රජයේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් මඩකලපුව, මන්මුනෛයි බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වවුනතිවු හි නිවාස 50කට අධික සංඛ්‍යාවක් ඉදිකරන ලද බවත්;

(ii) ඒ අතරින් බොහෝමයක් නිවාසවල වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් නොකර අඩුපාඩු සහිතව පවතින බවත්;

(iii) ඊට පසුව බලයට පත්වූ රජයන් විසින් එම නිවාසවල වැඩ කටයුතු අවසන් නොකළ බවත්;

(iv) ඒ හේතුවෙන් මේ වනවිට වර්ෂ 8කට වැඩි කාලයක් එම ජනතාව විවිධ දුෂ්කරතාවයන්ට මුහුණදී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඉහත නිවාසවල වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඉහත නිවාසවල වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට අපේක්ෂිත කාල වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

465/2025

ගරු රවී කරුණානායක මහතා,— වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අද වනවිට ශ්‍රී ලංකාවේ සීනි, කිරිපිටි, පරිප්පු, සහල්, තිරිඟු පිටි සහ පොල්වල මුළු පරිභෝජනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2010 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේ ඉහත අයිතමවල පරිභෝජනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (i) සහ (ii) අනුව ඒක පුද්ගල පරිභෝජනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත (i)හි සඳහන් එක් එක් අයිතමයෙන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද ප්‍රමාණය සහ ආනයනය කරන ලද ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත (i)හි සඳහන් එක් එක් අයිතමයේ ආනයන වටිනාකම ඇමරිකානු ඩොලර් සහ ශ්‍රී ලංකා රුපියල් වලින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) ඉහත (i)හි සඳහන් එක් එක් අයිතමයෙන් අය කරන ලද ආනයන බදු ප්‍රමාණය කවරේද;

(vii) ඉහත (i)හි සඳහන් එක් එක් අයිතමයේ තීරු බදු ඇතුළුව මිල කවරේද;

(viii) ඉහත සඳහන් එක් එක් අයිතමයේ නිෂ්පාදන පිරිවැය සහ සිල්ලර මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ix) ශ්‍රී ලංකාවේ ඉහත අයිතමවල නිෂ්පාදන පිරිවැය අතර සැලකිය යුතු වෙනසක් ඇතිවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

553/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා විමුක්ති පෙරමුණේ ආරම්භක නායක රෝහණ විජේවීර මහතාගේ බිරිඳගේ සහ දරුවන්ගේ නම් කවරේද;

(ii) රෝහණ විජේවීර මහතාගේ ඝාතනයෙන් පසු මේ දක්වා ඔවුන් ජීවත්වූ එක් එක් ස්ථානය සහ එම එක් එක් ස්ථානයේ ජීවත්වූ කාල සීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන්ගේ නඩත්තු වියදම් ශ්‍රී ලංකාවේ රජය විසින් දරා තිබේ නම්, ඒ සඳහා දරන ලද වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඔවුන්ගේ නඩත්තු කටයුතු වෙනත් පුද්ගලයෙක් හෝ පුද්ගල කණ්ඩායමක් විසින් දරා තිබේ නම්, නඩත්තු කරන ලද කාල සීමාව සහ ඒ සඳහා දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඔවුන්ගේ නඩත්තු කටයුතු සඳහා විදේශ රටවලින් ආධාර ලැබී තිබේද;

(vi) එසේ නම්, ආධාර ලබා දුන් රට, පුද්ගලයන් සහ ආධාර ලබා දුන් කාල සීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

566/2025

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී ‘ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ ව්‍යාපෘතිය’ නමින් ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද බව දන්නේද;

(ii) එම ව්‍යාපෘතියේ අරමුණු කවරේද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ස්ථාපිත කර ඇති ගබඩා සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලැබූ ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(v) එම ව්‍යාපෘතිය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

640/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.01.01 දින සිට මේ දක්වා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සහල් සම්බන්ධයෙන් සිදු කරන ලද වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැටලීම්වලදී අයකර ගන්නා ලද දඩ මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) සහල් සම්බන්ධයෙන් සිදු කරනු ලබන වැටලීම් තවදුරටත් වැඩි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1311/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2022 සිට 2024 දක්වා ව්‍යාපාරික කටයුතුවලට, සංචාරය සඳහා හෝ වෙනත් කටයුතු සඳහා මාලදිවයිනට ගිය ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව සහ ශ්‍රී ලංකාවට පැමිණි මාලදිවයින් ජාතිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මාලදිවයිනේ සංචාරය කරනු ලබන ශ්‍රී ලාංකිකයන් සඳහා 'පැමිණි විගස වීසා' (Visa on arrival) ලබා දීමෙන් ශ්‍රී ලංකාවට අත්වූ ප්‍රතිලාභය කවරේද;

(iii) දින අනුවක නිදහස් වීසා පහසුකම් ලබා දෙන ලද්දේ මාලදිවයිනට යන ශ්‍රී ලාංකිකයන් සඳහා පමණක්ද;

(iv) නොඑසේ නම්, ශ්‍රී ලංකාවට පැමිණෙන මාලදිවයින් ජාතිකයන්ටත් එම පහසුකම් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?